# ඇබෑර්තු

## ශ්‍රී ලංකා
## ප්‍රමිති ආයතනය
### විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

SRI LANKA STANDARDS INSTITUTION
GUARDIAN OF QUALITY

### කළමනාකරණ සහකාර - තාක්ෂණ (MA 2-2)

# තාක්ෂණ සහකාර (තනතුරු - 46)

**සුදුසුකම්**

බාහිර [ පහත (a) හෝ (b) හෝ (c) ]

**(a)** තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ, වෘත්තීය අභ්‍යාස ආයතනයක් විසින් නිකුත්කළ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් NVQ 5 වන තලයට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

**(b)** (i) අ.පො.ස. (සා/පෙළ) විභාගය සිංහල/දෙමළ, විද්‍යාව, ඉංග්‍රීසි හා ගණිතය යන විෂයන් ඇතුලත්ව විෂයන් 04 කට සම්මාන සමාර්ථ සහිතව විෂයන් 06 කින් සමත්ව සිටීම.

**සහ**

(ii) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව/භෞතික විද්‍යාව ඇතුළුව (සාමාන්‍ය පොදු ප්‍රශ්ණ පත්‍රය හැර) විද්‍යා විෂයන් 03 කින් සමත්ව සිටීම.

**සහ**

(iii) අදාළ ක්ෂේත්‍රයේ අවම වසර දෙකක (02) පළපුරුද්ද.

**(c)** (i) අ.පො.ස. (සා/පෙළ) විභාගය, සිංහල/දෙමළ, විද්‍යාව, ඉංග්‍රීසි හා ගණිතය යන විෂයන් ඇතුළුව විෂයන් 04 කට සම්මාන සහිතව විෂයන් 06 කින් සමත්ව සිටීම.

**සහ**

(ii) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයන් ඇතුලත්ව (සාමාන්‍ය පොදු ප්‍රශ්ණ පත්‍රය හැර) විද්‍යා විෂයන් 03 කින් සමත්ව සිටීම.

**සහ**

(iii) SLSI ආයතනයේ පුහුණුවන තාක්ෂණ සහකාර ලෙස වසර එකහමාරක් (1 1/2) රැකියා පුහුණුවක් සම්පූර්ණකර තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් ලබා තිබීම.

**වයස :** අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 නොවැඩි විය යුතුය.
(ඉහත වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නැත.)

**වෙනත් :** **සෑම අයදුම්කරුවෙකුම**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට අදාළව රාජකාරිය නිසි ලෙස ඉටුකිරීම සඳහාත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහාත් හැකිවන අයුරු මනා ශාරීරික හා මානසික සුවතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් යුක්තවිය යුතුය.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය**

ලිඛිත තරඟ විභාගයකින් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්. මෙම විභාගය එක් ප්‍රශ්ණ පත්‍රයකින් (පැය 03 ක) යුක්තවන අතර පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් ආවරණය කරනු ඇත.

- ඉංග්‍රීසි භාෂා ප්‍රවීණත්වය.
- අභියෝග්‍යතා පරීක්ෂණය හා සාමන්‍ය දැනීම.
- තනතුරට අදාළ විෂය දැනුම.
- පරිගණක සාක්ෂරතාවය.

**වැටුප් පරිමානය**

**LKR 50,540.00 - 10 x 540.00 - 7 x 630 - 4 x 1,080 - 19 x 1,280 - LKR 90,270.00**

(මෙම ගෙවීම් 2025/03/25 දිනැති කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 ප්‍රකාරව 2025 වර්ෂය සඳහා LKR 43,379.00, 2026 වර්ෂය සඳහා LKR 46,960.00 හා 2027 වර්ෂය සඳහා LKR 50,540.00 වශයෙන් තුන් වරකට (03) ගෙවනු ලැබේ.

**වෙනත් ප්‍රතිලාභ**

1. භාවිත නොකළ වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීම.
2. ජීවිතරක්ෂණ ආවරණය හා වෛද්‍ය රක්ෂණ අවරණය.
3. සීමාවකට යටත්ව වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කිරීම.
4. මහා භාණ්ඩාගාරය විසින් අනුමත කළ වාර්ෂික දිරිදීමනා.
5. වෘත්තීය වටපිටාවක සේවය කිරීමේ අවස්ථාව.

Link for Post of
Technical Assistant
Sri Lanka Standards
Institution (SLSI)
https://slsi.lk/en/careers/

**අයදුම්කරුවන් විසින් ඉහත සඳහන් සබැඳිය හෝ QR කේතය තුළින් අදාළ අයදුම්පත්‍රය බාගත කරගත යුතු අතර නිසි පරිදි සම්පූර්ණ කර අත්සන යොදා මෘදු පිටපතක් එම සබැඳියම හෝ QR කේතය හරහා 2026/01/19 දිනට පෙර ඉදිරිපත් කළ යුතුය.**

රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය. අයදුම්කරන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය.


අධ්‍යක්ෂ ජනරාල්

**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය**

නො. 17, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත, කොළඹ 08.
දුරකථන : 011 - 2671567 - 72


tamilguru.lk